ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

## ශෝක පණිවිඩය

මීට කලකට පෙර දිනෙක වැදගත් කරුණක් සාකච්ඡා කරලීම උදෙසා මට ගංගාරාමයේ පොඩි හාමුදුරුවන් වහන්සේ හමුවීමට අවශ්‍ය විණි. විමසූ කල්හි උන්වහන්සේ පැවසුවේ දින කිහිපයකට රටින් බැහැර වන බව ය. එවක අස්ගිරි මහානායක ධූරන්ධර උඩුගම බුද්ධරක්ඛිත හිමියන් වෛද්‍ය ප්‍රතිකාර පිණිස සිංගප්පූරුවට රැගෙන යාම පිණිසය.

අස්ගිරි මහා නායක හිමියන්ගේ වෛද්‍ය ප්‍රතිකාර සියල්ල සිදු කෙරුණේ පොඩි හාමුදුරුවන්ගේ මෙහෙයවීමෙනි. උන්වහන්සේට පත්‍ය වූ ආහාර වර්ග කොළඹ පිළියෙල කොට මහනුවරට යැවූ අවස්ථාවන් පවා තිබිණි. මේ කරුණු දැනගත් විට මට සිහිවූයේ දැස් අන්ධ තම ගුරු හාමුදුරුවන් වූ දෙවුන්දර වාචිස්සර හිමියන් වෙත සොළොස් හැවිරිදි වියේ සිට පොඩි හාමුදුරුවන් ඇප උපස්ථාන කළ ආකාරය යි.

උන්වහන්සේගේ මුළු මහත් ජීවිතය පුරාම මේ සුලක්ෂණය මම දුටුමි.

එනයින්, ගිලාන උපස්ථානයෙහි ලා උන්වහන්සේ ලොකුම ලොකු පොඩි හාමුදුරුවන් වූ සේක.

ලාංකේය තරුණ පරපුරට වෘත්තීය මං සැලසීමට හා ඉංග්‍රීසි භාෂා අධ්‍යාපනය ලබා දීමට උන්වහන්සේ වෙහෙසුණහ. අසරණ සරණ ව්‍යාපෘති ගණනාවක් දියත් කළහ. ස්වභාවික විපත් හමුවේ කඩා වැටුණු ජීවිතවලට රැකවරණය සැලසූහ. වැඩිහිටි මධ්‍යස්ථාන සේවා සුරැකුම් මධ්‍යස්ථානයන් ද පිහිටවූහ. සමාජ මෙහෙවර සම්බන්ධයෙන් බ්‍රිතාන්‍ය මහ රැජිණගේ සම්මානයෙන් ද පිදුම් ලැබූහ.

එනයින් සමාජ මෙහෙවරෙහි ලා උන්වහන්සේ ලොකුම ලොකු පොඩි හාමුදුරුවන් වූ සේක.

උන්වහන්සේ නැවුම් චින්තනයෙන් පෝෂිතය. කොළඹ නවම් පෙරහැර, ගංගාරමයේ වෙසක් කලාපය, බේරේ වැව සීමා මාලකය මතු නොව ගංගාරම විහාරස්ථානය පවා ඒ නැවුම් චින්තනයේ ප්‍රතිඵලයි. දේශිය බැතිමතුන්ට පමණක් නොව, මෙරටට පැමිණෙන විදේශීය සංචාරකයන්ට පවා සුදුසු හා ආකර්ශනීය ආගමික කේන්ද්‍රස්ථානයක් බවට ගංගාරාමය පත් කරන්නට උන්වහන්සේ කටයුතු කලහ.

එනයින් අලුත් අලුත් දෑ නිර්මාණයෙහි ලා උන්වහන්සේ ලොකුම ලොකු පොඩි හාමුදුරුවන් වූ සේක.

තායිලන්තය, ජපානය, තායිවානය, කොරියාව හා සිංගප්පූරුව ආදී ආසියාතික රටවල ථෙරවාද ආගමික කාර්යයන් ප්‍රචලිත කරලීමට උන්වහන්සේ මූලිකත්වය ගත්හ. ඇමෙරිකාව, මහා බ්‍රිතාන්‍ය ආදි අපරදිග රටවල ධර්ම ප්‍රචාරයෙහිලා සහාය වූහ. මේ විදේශ සම්බන්ධතා ගංගාරාම විහාරස්ථානයේ පමණක් නොව සමස්ත ශ්‍රී ලංකාවේම ආගමික හා සමාජයීය කටයුතු ප්‍රවර්ධනය උදෙසා උපයෝගී කර ගත්හ.

එනයින් විදේශ සම්බන්ධතා ශක්තිමත් කර ගැනීමෙහිලා උන්වහන්සේ ලොකුම ලොකු පොඩි හාමුදුරුවන් වූ සේක.

උන්වහන්සේ පරිසරයට ආදරය කළා සේම පරිසරය රැක ගැනීම උදෙසා උත්සුක වූහ. ගස් බැංකුව ඒ අතර සුවිශේෂ ය. අකුරැස්සේ අක්කර 900ක වතුයායයක මහෝගනී, තේක්ක සහ අගාවුඩ් වගා කෙරෙනුයේ ඒ සංකල්පය ඔස්සේය. මෙමඟින් මුළු මහත් දකුණු පළාතටම අවශ්‍ය ඇට සහ පැළ බෙදා දීමට ද උන්වහන්සේ පියවර ගත්හ. මෙවැනි ව්‍යාපෘති ගණනාවකට උන්වහන්සේ අනුග්‍රහය ලබා දුන්හ.

එනයින් පරිසර සංරක්ෂණයෙහිලා උන්වහන්සේ ලොකුම ලොකු පොඩි හාමුදුරුවන් වූ සේක.

මේ බොහොමයක් කාර්යයන් සඳහා උන්වහන්සේ මුල පිරුයේ ඊට අවශ්‍ය සියලු සම්පත් සහිතව නොවේ. උන්වහන්සේ වෙත තිබුණේ සංවිධාන හැකියාව සහ අධිෂ්ඨානය පමණි. ඒ ද්විශක්තීන් සමඟ උන්වහන්සේ බොහෝ දෑ කළහ. කරන්නට බැරි යැයි සිතන බොහෝ දෑ උන්වහන්සේගේ අධිෂ්ඨාන හා සංවිධාන ශක්තිය හමුවේ යථාර්ථයක් බවට පත් විය.

එනයින් සංවිධාන හා අධිෂ්ඨාන ශක්තියෙහිලා උන්වහන්සේ ලොකුම ලොකු පොඩි හාමුදුරුවන් වූ සේක.

වසර අසූ එකක ජීවිත කාලය පුරා ලොකුම ලොකු කාර්යයන්ගෙන්, අප රටට අති මහත් වූ ශාසනික, සමාජයීය සේවාවන් රාශියක් ඉෂ්ඨ සිද්ධ කළ පූජ්‍ය ගලබොඩ ඥානිස්සර පොඩි හාමුදුරුවන් වහන්සේට නිවන් සුව ලැබේවා.

රනිල් වික්‍රමසිංහ
ජනාධිපති
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

2024 අගෝස්තු 04 වන දින